www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ව්‍යාපාර කඩා වැටීම් හා දොට්ට දැමීම් රැල්ලක තර්ජනය ගෙනෙන සීඅයිටී අර්බුදය

## CIT crisis threatens wave of business failures and layoffs

**බැරී ග්‍රේ විසිනි**

**2009 ජූලි 18**

එක්සත් ජනපදයේ කුඩා හා මධ්‍යම පරිමාන සමාගම් දශ ලක්ෂයකට පමන මූල්‍ය පහසුකම් සපයන නිව් යෝර්ක්හි සීඅයිටී බැංකුවට, කල් පසුවූ නය සඳහා සහතිකවීම හෝ අනෙකුත් හදිසි ආධාර සැපයීම ඔබාමා පරිපාලනය විසින් ප්‍රතික්ෂේප කර තිබේ.

15 වන දින වනවිට ආන්ඩුවෙන් සහන ලබාගැනීමේ සීඅයිටී උත්සාහය බිඳ වැටීම බංකොලොත්කමේ අද්දර වැනෙමින් තිබෙන වසර 101 ක් පැරනි බැංකුවට ඉතිරිකර ඇත්තේ, සිල්ලර වෙලඳුන්ට හා සැපයුම්කරුවන්ට අරමුදල් සැපයීම කපාහැරීම පමනි. මෙය වනාහි, මෝටර් රථ කම්කරුවන් ගේ වැටුප් හා සහන කැපීම හා දස දහස් ගනනක් දොට්ට දැමීමට තුඩුදෙන පරිදි ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම් බංකොලොත්භාවයට ඇද දැමීමේත්, මෝටර් රථ ගනු දෙනු කරුවන් බංකොලොත් කිරීමේත්, මූල්‍ය බංකොලොත්භාවයට මුහුනපා සිටින කැලිෆෝනියා හෝ වෙනත් ප්‍රාන්ත සඳහා මහ ආන්ඩුවෙන් කිසිදු මූල්‍යාධාරයක් සැපයීම ප්‍රතික්ෂේප කිරීමේත්, ආන්ඩුවේ තීරනයෙහි එක් කොටසකි.

බැංකු පද්ධතිය වෝල් වීදියේ යෝධ සමාගම් කිහිපයක අතෙහි තවදුරටත් තහවුරු කෙරෙන පරිදි, දුබල හා කුඩා මූල්‍ය ආයතන බිඳ වැටීමට ඉඩ හරින පරිපාලනයේ ප්‍රතිපත්තියට එය අනුකූල වෙයි.

සීඅයිටී එක්සත් ජනපදයේ 26 වන විශාලම බැංකුවයි. එහි බංකොලොත්භාවය සලකුනු කරන්නේ, එක්සත් ජනපද ඉතිහාසයේ, වත්කම්වලට අනුව හතරවන විශාලතම බැංකු ඇනහිටීමයි. වේගයෙන් දියවී යාමට තුඩුදිය හැකි වර්ධනයක් වන බංකොලොත්වීමේ ආරක්ෂාව, සඳහා 11 වන පරිච්ඡේදයේ පිහිට පැතීම බැංකුව 17 වන දින තෙක් කල්දැමීමට බලාපොරොත්තු වෙයි.

බංකොලොත්භාවය සලකා බලන අධිකරනයේ දී පන රැක ගැනීම සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමානයක් ලබාගැනීම හෝ බංකොලොත්භාවයේ නඩුවක් ගොනුකිරීම වලක්වා ගැනීම යන දෙකෙන් එකක් වෙනුවෙන් නය ගැනීම සඳහා බැංකුව, 17 වන දින ගෝල්ඩ්මන් සැක්ස්, ජේපී මෝගන් චේස් හා මෝගන් ස්ටැන්ලි බැංකු සමඟ සාකච්ඡා කරන බව වාර්තා විය. *නිව් යෝර්ක් පෝස්ට්* පත්‍රය වාර්තා කලේ වත්කම් අනුව විශාලතම එක්සත් ජනපද බැංකුව වන ජේපී මෝගන් උනන්දු වන්නේ සීඅයිටී හි විශාලතම හා වැඩිම ලාභදායී ව්‍යාපාරය වන වෙලඳ නියෝජිත ඒකකය අත්කර ගැනීමටය.

රටේ විශාලතම වෙලඳ නියෝජිතයා වශයෙන් ප්‍රධාන කොටම සිල්ලර ව්‍යාපාරික ක්ෂේත්‍රයේ දහස් ගනන් නිෂ්පාදකයන් හා සැපයුම් කරුවන් ගෙන් සීඅයිටී මිලට ගැනීමේ යෙදී සිටියි. ගාස්තුවක් අයකර ගනිමින් බැංකුව සිය ගනුදෙනු කරුවන්ට එවෙලේ ම මුදල් ලබා දෙයි. ඒ මගින් ගනුදෙනු කරුවන්ට ඔවුන්ගේ සැපයුම් හා බඩු තොග සඳහා සිල්ලර වෙලඳුන් මුදල් ගෙවන තෙක් දින 30 සිට 90 දක්වා කාලයක් බලා සිටීමට සිදු නොවෙයි. සිය ගනුදෙනු කරුවන්ගේ සිල්ලර ගැනුම් කරුවන් බංකොලොත් වූ විට පවා ඔවුන්ට මුදල් ගෙවීම බැංකුව විසින් සහතික කරයි.

එක්සත් ජනපදයේ වෙලඳ නියෝජිත අංශයේ වෙලඳ පොලින් සීඅයිටී සියයට 60 ක් පාලනය කරයි. රට පුරා සිල්ලර වෙලඳුන් ලක්ෂ තුනක් වෙත සිය භාන්ඩ  සපයන නිෂ්පාදකයන් හා සැපයුම් කරුවන් 2,000ක ගේ වෙලඳ නියෝජිත ලෙස බැංකුව කටයුතු කරයි.

සීඅයිටී බංකොලොත්වීම සැපයුම් ජාලයන් බිඳ දමමින් හා ව්‍යාපාරයන්ට තම බිල්පත් ගෙවාගත නොහැකි තත්ත්වයක් නිර්මානය කරමින් මුදල් හා නය ගලායාමට බාධා පමුනුවනු ඇතැයි සැපයුම්කරුවන් මෙන්ම සිල්ලර වෙලඳුන් ද බියට පත්ව සිටියි.

ඩුඩැක් පර්යේෂන කාන්ඩයේ ආයෝජන මූලෝපායෙහි ප්‍රධානියා වන ගේල් ඩුඩැක් සිය ගනුදෙනු කරුවන්ට පවසා ඇත්තේ "බැංකුවේ කඩා වැටීම නය පහසුකම් හා වෙලඳාමේ මුදල් සඳහා සීඅයිටී මත රඳ පවතින කුඩා හා මධ්‍යම මට්ටමේ ව්‍යාපාර දහස් ගනනක් හරහා නිසැකව ම කම්පන දහරාවක් ගමන්

කරනු නොවැලැක්විය හැකිය. මෙය තව තවත් බංකොලොත්වීම් වල හා තව තවත් විරැකියාවේ අන්තරාය මතු කරයි. එසේම දැනටමත් අඩමාන තත්ත්වයේ පවතින ආර්ථිකය කෙරෙහි සැලකිය යුතු රිනාත්මක බලපෑමක් කරනු ඇත" යනුවෙනි. ක්‍රාෆ්ට්මාස්ටර් ලී බඩු සමාගමේ ප්‍රධාන විධායක රෝයි කැලිග්නී පැවසුවේ සීඅයිටී හි අර්බුදය නිසා ලී බඩු කර්මාන්තයේ සමස්ත සැපයුම් ජාලයම බිඳ වැටිය හැකි බවයි. "දැවැන්ත කම්පන බලපෑමක් ඇති කල හැකි මේ පිලිබඳව ආන්ඩුව සැලකිලිමත් වන්නේ දැයි මම නොදනිමි. විශේෂයෙන්ම සැපයුම් ජාලයන් කෙරෙහි මෙය බලපාන ආකාරය දෙස ඔබ අවධානය යොමුකරන්නේ නම් එය අපගේ කර්මාන්තයට විනාශකාරී වනු ඇත." ඔහු පැවසීය.

රීස්මන් පීරෙස් රීස්මන් නම් බංකොලොත්වීම් පිලිබඳව කටයුතු කරන නීති ආයතනයක ජෙරී රීස්මන් නමැති නීතිඥයා රොයිටර් මාධ්‍ය වෙත පැවසුවේ, නය පහසුකම් වැසී යාම පිලිබඳව කලබලයට පත්ව සිටින, බලාපොරොත්තු සුන්වූ ඇඟලුම් සමාගම්වලින් ලැබෙන දුරකථන ඇමතුම්වල තමන් "ගිලීගොස් සිටින" බවයි. "ආන්ඩුවේ තීරනයෙහි ප්‍රතිපල වශයෙන් බොහෝ සමාගම් වලට සති අන්තයේ වැටුප් බිල හා සැපයුම්කරුවන්ගේ බිල්පත් ගෙවාගත නොහැකිවනු ඇත. එම සමාගම් බොහොමයක් හා ඔවුන්ගේ සැපයුම් කරුවන්ට, ආර්ථිකයේ තවදුර පහත වැටීමට තුඩුදිය හැකි, බංකොලොත් වීමේ ඉල්ලීම් ගොනු කිරීමට බලකෙරෙනු ඇත."

ශේෂ පත්‍රයේ ඩොලර් බිලියන 80 ක් සටහන් වන සීඅයිටී, කාර්තු අටක් තුල එක දිගට බිලියන 3 ක අලාභයක් වාර්තාකර තිබේ. එහි වත්මන් ප්‍රධාන විධායක ජෙෆ්රි පීක් පාලනය භාරගත් 2004 වසර ආරම්භයේ පටන් බැංකුව, අවමුඛ උකස්කර හා ශිෂ්‍ය නය තුල ගිලී ගියේය. විශේෂයෙන්ම අවමුඛ උකස්කර බිඳවැටීම හා එහි ප්‍රතිපල වශයෙන් පැමිනි නය අර්බුදයේ බලපෑම යටතේ, තැන්පතු රැස්කිරීමට වඩා සිය දිගු කාලීන නය ගෙවාගැනීම සඳහා කෙටිකාලීන වානිජ්‍ය නය මත රැඳී සිටින සීඅයිටී ගැඹුරු අර්බුදයකට මුහුනපා සිටියේය.

පසුගිය දෙවසරක කාලය තුල එය තොග නය වෙලඳපොලින් ඉවතට වීසි විය. පසුගිය දෙසැම්බරයේ දී එය අමාරුවේ වැටුනු වත්කම් වෙනුවෙන් සහන වැඩ සටහන යටතේ (TARP) බිලියන 2.3 ක මුදල් ලබාගැනීමේ අටියෙන්, බැංකු භාරකාර සමාගමක් ලෙස ලියාපදිංචි වීමට ආන්ඩුවේ අවසරය ලබා ගත්තේය.

සීඅයිටී අගෝස්තු මාසයේ බිලියන 1.1 ක ද වසර අවසානයේ තවත් බිලියන 2.5 ක ද නය ගෙවීමට නියමිතව සිටියි. ෆෙඩරල් සංචිත මන්ඩලය බැංකුව පිලිබඳව මේ සතිය මුල "දරාසිටීමේ හැකියාව පිලිබඳ පරීක්ෂනයක්" (stress test) සිදුකල බවත්, සක්‍රියව සිටීමට නම් අඩුම තරමින් එයට බිලියන 4 ක ප්‍රාග්ධනයක් අවශ්‍ය බවට නිගමනය කල බවත් වාර්තා විය.

එහි සමපේක්ෂන තල්ලුවේ ගැටලු, ඔබාමා පරිපාලනය විසින් "ඇදවැටීමට ඉඩදිය නොහැකි තරම් විශාල" යයි සලකන ලද හා බදු ගෙවන්නන්ගේ මුදලින් බිලියන සිය ගනන් ගතමනා ලබාගෙන ඇති ගෝල්ඩ්මන් සැක්ස්, ජේපී මෝගන්, සිටිගෲප්, බැන්ක් ඔෆ් ඇමරිකා හා ඇමරිකන් ඉන්ටර්නැෂනල් ගෲප් වැනි යෝධ බැංකු හා මූල්‍යායතන වලට වඩා, අවශ්‍යයෙන්ම වෙනස් නොවීය.

පරිපාලනයේ ප්‍රකාශකයෙකු කියා සිටියේ, සීඅයිටී හදිසි ආධාර ප්‍රතික්ෂේප කිරීමේ තීරනයෙන් පෙන්නුම් කරන්නේ ආන්ඩුවේ සහාය ලබාගත හැකි ආයතන කවරේ ද යන්න පිලිබඳව ඔබාමාට "ඉතා ඉහල අවබෝධයක්" තිබෙන බවය. ඊටත් වඩා එය පෙන්නුම් කරන්නේ වෝල් වීදියේ ලොක්කන් විසින් පරිපාලනයේ ආර්ථික ප්‍රතිපත්ති තීන්දු කිරීමෙහි ලා කෙතරම් වැදගත් කමක් උසුලන්නේ ද යන්නයි. පසුගිය වසරේ මූල්‍ය අර්බුදය පැන නැඟි තැන් පටන් ආන්ඩුව, බෙයාර් ස්ටියර්න්ස්, ලේමන් බ්‍රදර්ස්, මෙරිල් ලින්ච්, වැකෝවියා හා වොෂින්ටන් මියුචුවල් අන්ත්‍රස්ධාන කිරීමෙහි ලා කටයුතු කරමින් විශේෂයෙන්ම, ගෝල්ඩ්මන් සැක්ස් හා ජේපී මෝගන් චේස් වැනි ශක්තිමත් දැවැන්ත බැංකුවල ආර්ථික අධිකාරය ඉමහත් ලෙස වැඩි දියුනු කර තිබේ.

වෝල් වීදියේ විශාලතම ආයතන වල අධිකාරය තව දුරටත් ශක්තිමත් කිරීමට ඉවහල් වන පරිදි, කුඩා ප්‍රදේශිය බැංකු රොත්තක් බංකොලොත්භාවය කරා ඇදී යමින් තිබේ. 16 වන දින සෙනේට් බැංකු කමිටුවේ දී කෙන්ටුකී ප්‍රාන්තයේ රිපබ්ලිකානු සෙනේට් සභික ජිම් බියුනින් ප්‍රකාශ කලේ "කිසියම් ආශ්චර්යයක් සිදු නොවුන හොත්" තවත් බැංකු 500 ක් බිඳ වැටෙනු ඇති බව ෆෙඩරල් තැන්පතු රක්ෂන සංස්ථාවේ සභාපති ශීලා බයර් තමන් සමඟ පැවසූ බවයි.

සීඅයිටී ආධාර ප්‍රතික්ෂේප කිරීමේ තීරනය ගෙන ඇත්තේ, ගෝල්ඩ්මන් සැක්ස් හා ජේපීමෝගන් චේස් දෙවැනි කාර්තුව සඳහා ආකර්ශනීය ඉපැයුම් වාර්තා කරන අතරතුර ය. කාර්තුව සඳහා ගෝල්ඩ්මන් බිලියන 3.44 ක ඉපැයීම් වාර්තා කල අතර ජේපීමෝගන් බිලියන 2.7 ක ලාභයේ තියුනු නැඟීමක් වාර්තා කලේය. බැංකු දෙකම සිය ලාභයෙන් ලොකු පංගුවක් හිමිකර ගෙන ඇත්තේ ඔවුන්ගේ ආයෝජන බැංකු හා වානිජ්‍ය අංශයන් ගෙනි.

ඔවුන් වාසි ලබා ඇත්තේ සිය තරගකරුවන්ගේ අභාවයෙන් හා, කොටස් හා බැඳුම්කරයන්හි මිල උච්ඡාවචනය මත ස්වකීය ඔට්ටු ඇල්ලීම සඳහා වෙලඳපොල කැලඹීම්වල වාසිය ගසාකන අතර වාරයේ, කොටස් හා බැඳුම්කර ප්‍රතිරක්ෂනය කිරීම

මඟින් උත්පාදිත ගාස්තු අයකර ගැනීම සඳහා ඔවුන්ට විශාල ඉඩ ප්‍රස්ථා සැලසූ බැන්ක් ඔෆ් ඇමරිකා හා සිටිගෘප් මුහුනපා ඇති අර්බුදය මතින් ය. මොවුන් හෝ අනෙකුත් කිසිදු ප්‍රධාන බැංකුවක් ආන්ඩුවේ මුදල් හා අනෙකුත් ආධාර මඟින් සලසා දුන් දිවියොත, (lifeline) ව්‍යාපාරවලට හා පාරිභෝගිකයන්ට සැලකිය යුතු පරිදි නය පහසුකම් වැඩිකිරීම සඳහා යොදාගෙන නොතිබුනි.

ඔවුන් සිය බැංකු ශේෂපත්‍ර වල ඇතැයි ගනන් බලා තිබෙන ට්‍රිලියන දෙකක විෂ සහිත (toxic assets) වත්කම් සැඟවීමේ යෙදී සිටිති. වටිනාකම බිංදුවට ලඟාවී ඇති ඔවුන් සතු වත්කම්, වෙලඳපොලේ මිලට අලෙවි කිරීම හෝ ඒවායේ අගය කපා හැරීම ඔවුහු ප්‍රතික්ෂේප කරති. ජේපීමෝගන් ඉහල ලාභ වාර්තා කර ඇතත් පාරිභෝගික හා වානිජ්‍ය දේපල නය වලින් දැවැන්ත අලාභ ලබා ඇති බව වාර්තා කරයි. 17 වන දින නිකුත් කල ඉපැයීම් වාර්තාවලට අනුව සිටි ගෘප් හා බැන්ක් ඔෆ් ඇමරිකා මේ අංශ වලින් ඒ හා සමාන අලාභ වාර්තා කරයි. මහා විරැකියාව, තව තවත් පාරිභෝගික හා ප්‍රමුඛ උකස්කර නය පැහැරහැරීම් හා අවපාතය මඟින් වානිජ්‍ය දේපල අගය තව දුරටත් ප්‍රපාතයට හෙලීමේ බලපෑම හමුවේ, ඉහත කී වත්කම් දිගටම පිරිහී යනු ඇත.

විධායකයන් හා ජ්‍යෙෂ්ඨ සේවකයන් වෙනුවෙන් වාර්තාගත වන්දි පිරිනැමීම් සඳහා වේදිකාව සකසමින් ගෝල්ඩ්මන්, කාර්තුව තුල බිලියන 13.8 ක් වූ සිය ආදායමෙන් හරි අඩක් පමන ම වැටුප් හා ප්‍රතිලාභ සඳහා පසෙකට කරගෙන ඇත. බැංකු විසින් ඉහල විධායකයන් සඳහා ඉලක්කම් හතේ අටේ සන්තෝසම් ගෙවීමේ පොදු සම්ප්‍රධාය සමඟ මෙය මනාව ගැලපේ.

ධවල මන්දිරයේ කාර්ය මන්ඩල ප්‍රධානී රාම් ඉමැනුවෙල් ව්‍යංගයෙන් සඳහන් කලේ, ගෝල්ඩ්මන් හා ජේපීමෝගන් විසින් වාර්තාකර ඇති දැවැන්ත ඉපැයුම්, සීඅයිටී කපාහැරීමේ තීරනය යුක්තිසහගත කරන බවයි. බැංකු පද්ධතිය ගොඩගැනීමේ ආන්ඩුවේ උත්සාහය තුල "සංසුන් බවේ හැඟීම වෙනස්වූ අදියරක සංකේතයක්" බව ඔහු කීවේය.

ඒ හා සමාන ලෙස ඔබාමාගේ ප්‍රධාන ආර්ථික උපදේශක ලෝරන්ස් සමර්ස් වොෂින්ටන් ඩීසී හි දී කථාකරමින් පැවසුවේ, මූල්‍ය පද්ධතිය "අගාධයෙන් ගොඩවී ඇති" බවයි. භාන්ඩාගාර ලේකම් තිමෝති ගේත්නර් පැවසුවේ, මූල්‍ය වෙලඳපොලවල් "ගොඩ ඒම පිලිබඳ වැදගත් සංඥා" නිකුත් කර ඇති බවයි.

© www.wsws.org